**ශ්‍රී ලංකාප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

# <u>ලංසු කැඳවීම</u>

1. මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු(හිනිදුම) කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් හිනිදුම විධායක ඉංජිනේරු කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන පහත ව්‍යාපෘතීන් සඳහා කියුබ් 01 ටිපර් රථ(01 Cube Tipper) ලබා ගැනීමට සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් සැපයුම්කරුවන් වෙතින් මිළ ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | විස්තරය |
|---|---|
| 01. | මාර්ග සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික්කයේ කි.මී.1,500 විකල්ප මාර්ග පද්ධතිය ක්‍රියාත්මක කිරීම යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය/වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා සහ විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් මාර්ග නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ටිපර් රථ(කියුබ් 1) සැපයීම.<br>විධායක ඉංජිනේරු කොට්ඨාශය-හිනිදුම.<br>**RDA/SP/G/EE(H)/Tip/2024-01** |

2. මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් සැපයුම්කරුවන් 2024.03.25 දින සිට 2024.04.08 දින දක්වා සතියේ දිනයන්හිදී පෙ.ව.09.00 සිට ප.ව.3.00 දක්වා කාලය තුල එක් මිලගණන් පතක් සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් 605.13 (වැට් බදු සහිත)ගාස්තුවක් බැගින් සහ ලිඛිත අයදුම්පතක් "විධායක ඉංජිනේරු(හිනිදුම),මාර්ග සංවර්ධන අධිකාරිය,තල්ගස්වල" වෙත ඉදිරිපත් කිරීමෙන් මිළ ගණන් ඉදිරිපත් කිරීමට අදාල අයදුම්පත් ලබාගත හැකිය.

   කාර්යාලයට පැමිණ ලංසු අයදුම්පතක් ලබා ගත නොහැකි සැපයුම් කරුවන්හට eehiniduma@gmail.com වෙත ඊ මේල් පණිවිඩයක් යොමු කිරීම මගින් අයදුම්පත් ගෙන්වා ගත හැකි අතර ඔවුන් එම මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මුදල් ගෙවා රිසිට් පතක් ලබා ගෙන එය ද මිළ ගණන්පත් සමඟ ඉදිරිපත් කල යුතුය.එසේ නොවන මිළ ගණන් පත් ප්‍රතික්ෂේප වේ.

3. සම්පූර්ණ කළ මිළගණන් පත් 2024.04.08 දින පෙ.ව.10.00 ට පෙර"විධායක ඉංජිනේරු(හිනිදුම),මාර්ග සංවර්ධන අධිකාරිය,තල්ගස්වල" යන ලිපිනයට එවීම හෝ කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කල යුතුය ප්‍රමාදවී ලැබෙන මිළගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.මිළ ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ලංසු කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ එකී මිළ ගණන් විවෘත කරනු ලැබේ.

4. අදාල සැපයුම ලබා දී ඇති කොන්දේසිවලට අනුකූල විය යුතුයි.(ඇමුණුම 01)

5. ඔබගේ මිළගණන් පත් බහා එවන කවරයේ වම්පස් ඉහළ කෙළවරෙහි"කුලී පදනම මත කියුබ් 01 ටිපර් රථ(01 Cube Tipper)සැපයීම" යනුවෙන් සටහන් කල යුතුය.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර දුරකථන අංක 091-2296419 ඇමතීමෙන් දැන ගත හැකිය.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**විධායක ඉංජිනේරු කාර්යාලය(හිනිදුම),**
**මාර්ග සංවර්ධන අධිකාරිය,**
**තල්ගස්වල.**

**<u>ඇමුණුම 01</u>**

**මාර්ග සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික්කයේ කි.මී.1,500 විකල්ප මාර්ග පද්ධතිය ක්‍රියාත්මක කිරීම යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය/වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා සහ විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් මාර්ග නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ටිපර් රථ (කියුබ් 1) සැපයීම.**

**<u>කොන්දේසි</u>**

1. යන්ත්‍ර/වාහන උසස් ක්‍රියාකාරිත්වයක්/උසස් ධාවන තත්ත්වයක් තිබිය යුතු අතර එම යන්ත්‍ර/වාහන තෝරා ගැනීමේදි ලියාපදිංචි වර්ෂය අනුව ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.
2. මනා තත්ත්ව පරීක්ෂණයකින් පසු ධාවනයට සුදුසු යන්ත්‍ර/වාහන තෝරා ගනු ලැබේ.
3. රියැදුරු/ක්‍රියාකරු සතුව පූර්ණ රක්ෂණාවරණයක් හා නියමිත බලපත්‍රයක් තිබිය යුතු අතර මාර්ග සංවර්ධන අධිකාරිය සෑහිමකට පත්වන අයුරින් ඔහු විසින් රාජකාරි ඉටුකල යුතුය.
4. ලංසුකරු විසින් ඉන්ධන,අලුත්වැඩියා ගාස්තු,සේවා වියදම් හා රියැදුරන්ගේ /යන්ත්‍රකරුවන්ගේ වැටුප අතිකාල දීමනා සහ සංයුක්ත දීමනා දැරිය යුතුය.
5. වාහනය හෝ යන්ත්‍රය යොදා ගන්නා දින ගණන හිනිදුම විධායක ඉංජිනේරු විසින් තීරණය කරනු ලැබේ.
6. සිදුවන අනතුරු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වගකියනු නොලබන අතර කිසිම අලාබයක් සඳහා ගෙවීම් කිරීමට බැදී නොමැත.නමුත් මාර්ග සංවර්ධන අධිකාරියේ දේපල සඳහා වන හානි වෙනුවෙන් සැපයුම්කරු ගෙවීමට බැදී ඇත.
7. යන්ත්‍රය/වාහනය යම් අනතුරකට ලක්වීම හෝ වෙනත් කාරණයක් හේතුවෙන් සේවය සඳහා ලබා දීමට නොහැකි අවස්ථාවක ලිඛිතව ඒ බව දැනුම් දිය යුතුය.තවද යන්ත්‍රය/වාහනය යම් අළුත්වැඩියා කටයුත්තක් සඳහා දින 02ට වැඩි කාලයක් නතර කරනු ලබන්නේ නම් ඒ සඳහා වෙනත් යන්ත්‍රයක්/වාහනයක් සැපයීම ඔබ සතු වගකීම වන අතර එසේ නොවන්නේ නම් එවැනි අවස්ථාවක කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හා එම සිද්ධියට ප්‍රථම වාහනය ධාවනය කිරීම වෙනුවෙන් කලයුතු ගෙවීම් නොගෙවා සිටීමට මාර්ග සංවර්ධන අධිකාරියට බලය ඇත.
8. සේවා කාලය පෙ.ව08.00-ප.ව.05.00 අතර අනිවාර්ය සේවයේ යෙදවිය යුතු අතර හදිසි අවස්ථාවකදී එම කාලසීමාවට අමතරවද සේවයේ යෙදවිය යුතුය.පලපුරු රියැදුරන් යෙදවීම අනිවාර්ය වේ.
9. මාර්ග සංවර්ධන අධිකාරියේ උපදෙස් පරිදි රියැදුරු විසින් දෛනික ධාවන සටහන් ලිවිය යුතු අතර දිනපතා සම්පූර්ණ කරන ලද දෛනික ධාවන සටහන් සෑම සතියකම සඳුදා දින වාහන පාවිච්චි කරනු ලබන නිලධාරියාට ඉදිරිපත් කල යුතුය.
10. එමෙන්ම ඔබ වැට්(Vat) ලියාපදිංචි කරුවෙක් නම් එම අගය සඳහන් කල යුතු අතර ඒ සඳහා ලියාපදිංචි වී ඇති අංකය සහිත සහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතුය.
11. දැනට වලංගු ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය,ටෙන්ඩර් ප්‍රදානය කිරීමේදී හා ඊට අදාල අනෙකුත් කටයුතු වලදී අනුගමනය කෙරේ.